**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>අධ්‍යයන වර්ෂ 2021-22 සඳහා ඩයස්පෝරා දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව වැඩසටහන</u>**

ඉන්දියානු රජය විසින් 2006-07 වර්ෂයේ සිට "ඩයස්පෝරා දරුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් (SPDC) ක්‍රියාත්මක කරයි. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ඉන්දියානු විශ්ව විද්‍යාල /ආයතනවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයින්ට සහ අනේවාසික ඉන්දියානු ජාතිකයින්ට මූල්‍යාධාර ලබා දේ. මේ යටතේ ශිෂ්‍යත්වලාභීන්ට වෘත්තීය සහ වෘත්තීය නොවන (වෛද්‍ය/පරිපූරක වෛද්‍ය හැර) පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍යාධාර හිමිවනු ඇත. කෙසේවුවත්, මේ සඳහා අයැදුම් කළ හැක්කේ පළමු වසර සිසුන්ට පමණි.

2. ඉහත කාණ්ඩයන්ට අයත් ශ්‍රී ලංකාවේ සිටින සිසුන් ද මෙම ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබයි.

3. ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳ වැඩිදුර විස්තර http://www.spdcindia.gov.in/login/guideline.php යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සුදුසුකම් ලත් සිසුන්ට 2021 නොවැම්බර් 30 වැනිදා දක්වා මෙම වෙබ් අඩවිය ඔස්සේ ඍජුවම අයදුම්පත් යොමු කළ හැක.

****

2021 ඔක්තෝබර් 9
කොළඹ